ඉරානය

ආරාධනා නොකළ අමුත්තෝ

ලේඛක
පරිදෙහ් පර්යම්

චිත්‍ර
අමීර් – අලි බරූතියන්

එකමත් එක කාලෙක, පුංචි ගම්මානෙක වයසක ආච්චි කෙනෙක් හිටියා. ඇගෙ පුංචි ගෙදර මිදුල, පෙනේරයක් තරම්. මිදුලෙ ගහක් තිබුණා ගිතිකුරක් තරම්.

මේ ආච්චි හරි ම කරුණාවන්ත යි. ළමයි හැම දෙනා ම ආච්චිට හරි ම ආදරෙයි.

එක දවසක හැන්දවක, ඉර බැහැ ගෙන ගිහින් ගේ ඇතුළ කළුවර වේ ගෙන එන කොට, ආච්චි ඇගේ ලාම්පුව පත්තු කරලා, ජනෙල් පත්ත උඩ තිබ්බා. එළිමහෙත ටිකක් ඉන්න යි, අල්ලපු ගෙවල්වල අය එක්ක කතා කරන්ට යි තිවී හැනහිල්ලෙ ඉන්න යි කියලා, ඇගේ සාළුව පොරොව ගෙන, ඈ ගෙයින් එළියට බැස්සා.

ළමයි ටික දෙනෙක් එක්ක කතා කරමින් ඉන්න අතරේ යම්තම් පොද ගහන්නට පටන් ගත්තා. වැහි පොදවලින් මැටි බිත්ති තෙමුණා ම තගිත සුවඳ හැම තැන ම විහිදුණා.

ආච්චි ඇගේ පුංචි ගෙදරට ආපහු ගියා.

එතකොට වැස්ස තද වුණා.

ආච්චිට සීතලයි වගේ. බිම පැදුර එළා ගන්නට හදන කොට ම කවුදෝ දොරට තට්ටු කළා. ටක්, ටක්, ටක්.

" අයියෝ මේ වෙලාවෙ – කවුද දන්නෙ නෑ ? "ආච්චි ඇට ම කියා ගත්තා. " කවුද දොරට තට්ටු කරන්නෙ ? "

"මේ මම, ගේකුරුලු හාමි. මාව වැස්සට තෙමෙනවා. කරුණාකරලා දොර අරිනවා ද ?"

ආච්චි දොර ඇරලා, "එන්ට ඇතුළට" කිව්වා.

ගේකුරුලු හාමිගෙ හොටින් සට, සට, සට ගාලා වැහි බින්දු වැටෙනවා.

ඈ ඇගේ තටු ගැහුවා. පට, පට, පට ගාලා.

ආච්චි ගේකුරුලු හාමිව කාමරයට එක්ක ගියා. තෙමුණු තටු උඩින් රෙද්දක් දැම්මා.

ගේකුරුලු හාමි හොටෙන් අත් තටු කසන්න පටන් ගත්තා. ඒ වෙලාවෙ, ආයෙමත් ටක්, ටක්, ටක් ගාලා කවුද දොරට තට්ටු කරනවා ඇහුණා.

ආච්චි දුව ගෙන ගිහින් ඇහුවා, "කවුද දොරට තට්ටු කරන්නෙ ?"

"මේ මම, කකුල් කොට කිකිළි. මාව වැස්සට තෙමෙනවා. කරුණාකරලා දොර අරිනවා ද ?"

ආච්චි දොර ඇරලා, "හා, ඇතුළට එන්ට" කිව්වා.

කිකිළිගෙ පිහාටු එකට ඇලිලා, ඇස් හරි ම මහත්සි පාට යි. ආච්චි කිකිළිගෙ පිට උඩට රෙද්දක් දැම්මා. කාමරේ පැත්තකට කිකිළි ගිහින්, වේළෙන්නට ඇඟ ගසලා දැම්මා.

ආච්චි ඇගේ තෙත සාළුව අහකට ගන්නට හදනවත් එක්ක ම ආයෙමත් කවුද දොරට තට්ටු කළා. ටක්, ටක්, ටක්.

අදි-මදි නො කර, ආච්චි දොර ළඟට දුවලා ඇහුවා "කවුද දොරට තට්ටු කරන්නෙ ?"

"මේ මම, කපුටු අප්පු, මාව වැස්සට තෙමෙනවා. කරුණාකරලා දොර අරිනවා ද ?"

ආච්චි දොර ඇරලා, "හා, ඇතුළට එන්ට," කිව්වා.

දොරට ආයෙමත් කවුද තට්ටු කළා. ඒ ගමන බළලෙක් ඇතුළු වුණා. ගේකුරුලු හාමි ත්, කිකිළි ත්, කපුට ත් බළලා ඇතුළු වෙනවා දැක්කා ම, එකට ගුලි වෙලා බයෙන් වෙවුළන්න පටන් ගත්තා.

බළලා හිනාවෙලා කිව්වා, "බය වෙන්ට එපා. අපි ඔක්කොමලා මෙහෙ අමුත්තො නේ, ඉතින් තියෙන විදියට අපි ඉදිමු."

ඉතින් ඔක්කොමලා බය නැතුව නිදගන්නට හැදුවා.

බළලගෙ පිට උඩටත් ආච්චි රෙද්දක් දැම්මා. බළලා කොණකට ගිහින් දිගා වෙලා, ඇස් පියා ගෙන මූණයි අතුයි සෝදන්නට පටන් ගත්තා.

ආච්චිත් ඉඳ ගන්නට හදන කොට ම, ආයෙමත් ටක්, ටක්, ටක් ගාලා දොරට තට්ටු කරන සද්දෙ ඇහුණා.

ආච්චි දැන ගත්තා කරන්න ඕනැ මොකක් ද කියලා. සාළුවත් පොරොව ගෙණ දොර ළඟට ගිහින් ඇහුවා, "කවුද දොරට තට්ටු කරන්නෙ ?"

"මේ මම, මුර බල්ලා. මාව වැස්සට තෙමෙනවා. කරුණාකරලා දොර අරිනවා ද ?"

ආච්චි දොර ඇරලා, "හා, ඔයත් එන්ට ඇතුළට, " කිව්වා.

ක්ලික්, ක්ලික්, ක්ලික් – බල්ලා දත් කට ගැහෙනවා.

බල්ලාවත් ආච්චි කාමරයට ගෙන ගියා. බල්ලාගෙ බෙල්ලෙ ලේන්සුවක් ගැට ගහලා, නිදා ගන්නට පැත්තකට ගෙන ගියා.

ඒ වෙලාවෙ, කලින් තට්ටු කළාටත් වැඩිය හයියෙන් දොරට තට්ටු කළා. ටක්, ටක්, ටක්.

ආච්චි දොර ළඟට ගිහින් ඇහුවා, "කවුද දොරට තට්ටු කරන්නෙ ?"

"මේ මම, කළු ගොනා. මාව වැස්සට තෙමෙනවා, කරුණාකරලා දොර අරිනවා ද ?"

ආච්චි දොර ඇරලා කිව්වා, "හා හොඳයි, ඔයත් ඇතුළට එන්ට."

ගොනා කාමරේට ඇතුළු වුණේ, අං දෙක ඉස්සෙල්ලා පාත් කරලා. පස්සෙ කාමරේ ඇතුළට තද වෙලා ආවා.

අනිත් අය ගොනාව දැක්කා ම ඌට ඉඩ දෙන්නට එහාට මෙහාට වුණා. ගේ කුරුල්ලා ඔක්කොම බලලා කිචි බිචි ගාලා හිනා වුණා.

ගොනා කැහැලා කොනක දණ ගහ ගත්තා.

ආච්චි බ්ලැන්කේට්ටුවකින් ගොනා වැහුවා. ඇගේ අමුත්තන් දිහාට හැරිලා මෙහෙම කිව්වා. "හොඳයි ඉතින්, උඹලා ඔක්කොමලාට දැන් සතීපෙට නිදා ගන්ට පුළුවනි. හෙට උදේට උඹලගෙ ගෙවල්වලට යන්ට පුළුවන්."

ගේකුරුල්ලා යි කිකිළි යි කපුට යි ජනෙල් පත්ත උඩට පැනලා නිදන්නට ගියා. බළලා යි බල්ලා යි ගොනා යි බිම නිදා ගත්තා.

ආච්චිට ත් මහන්සි යි. ඈ රෙද්ද පොරවාගෙන නිදා ගත්තා.

පහුව ද උදේ, ආච්චි නැගිට්ටේ වෙනදට වඩා පරක්කු වෙලා. ඒ වුණාට ඇස් ඇරලා බැලුවා ම හැම දෙනා ම හරි ම කඩිසරෙන් වැඩ කරන හැටි දැක්කා. කපුටා ලිප පත්තු කළා. බළලා තේ වත්කරමින් හිටියා. බල්ලා වත්ත අතු ගගා හිටියා. ගොනා ගල් රෝලකින් තෙත වහලෙ හරි ගස්සමින් හිටියා. කිකිළි ගොනාට උදවු කළා.

ගේ ඇතුළෙ මේ වැඩ කටයුතු කෙරෙනවා බලලා ආච්චි හරි සන්තෝස වුණා. සාළුව පොරවා ගෙන ඈ පාන් ගේන්න කඩයට ගියා.

ආච්චි ආපහු ගෙදර ආවා ම, ඔක්කොමලා ලිප වටේට වාඩි වෙලා උදේ කෑම කෑවා. අන්තිම තේ කෝප්පය බොද්දී, ගොනා මෙහෙම කිව්වා. "ඊයෙ රෑ අපට යන්ට තැනක් තිබුණෙ නෑ. ඒත් දැන් ඉතින් අපට ආයුබෝවන් – අපි යනවා."

අමුත්තන් හැම දෙනාට ම තේරුම් ගියා ආච්චි කොච්චර කරුණාවන්ත ද කියලා. ඒ හින්දා යන්න හරි දුක හිතුණා.

ආච්චි මෙහෙම කිව්වා. "මං හිතන්නෙ මොකක් ද දන්නවා ද ? මං ආසයි ඔය ඔක්කොම මෙහෙ ඉන්නවා නම්. ඒ වුණාට මගේ ගේ පුංචියි – ඉඩ මදි. ගේකුරුලු හාමිට ඉන්න පුළුවන් වුණත් අනික් අයට නම් යන්ට වෙනවා."

ගොනා ටිකක් කල්පනා කළා. පස්සෙ කිව්වා, "තිරිඟු කපලා පාගලා දෙන්ට පුළුවන්. ඒ හින්ද මං යන්ට ඕනෑ ද ?

ගොනාගෙ හිත රිදුණු විත්තිය ආච්චිට තේරුම් ගිහින්, ඈ කිව්වා, "මේක ඉඩ මදි වුණත්, මාත් එක්ක ඉඳින්."

ගේකුරුල්ලා උගුර පාදලා කිව්වා, "මට සින්දු කියන්න පුළුවන්. ආච්චිට පුංචි බිත්තර දලා දෙන්නම්. මං යන්ට ඕනෑ ද ?

ආච්චි හිනා වෙලා කිව්වා, "උඹට එච්චර ඉඩ ඕනෑ නෑ. ඒ හින්ද හිටියාට කමක් නෑ."

බළලා වලිගය ඇඟ වටා කරකවා ගෙන කිව්වා, "මට ඤාව් කියලා මීයො අල්ලන්ට පුළුවනි. මං යන්ට ඕනෑ ද ?"

ආච්චි කිව්වා, "අනේ පූසො, හිත නරක් කර ගන්ට එපා. උඹත් හිටපන්."

"කපුටා කිව්වා," කාක්, කාක් කියලා අඬලලා, මට මිනිස්සුන් අවදි කරවන්ට පුළුවනි. ඒ හින්ද මං යන්ට ඕනෑ ද ?"

ආච්චි කිව්වා, "උඹටත් ඉන්ට පුළුවනි."

කිකිළි කිව්වා, "මට කෙකර ගගා ලොකු බිත්තර දමලා දෙන්ට පුළුවනි. මං යන්ට ඕනෑ ද ?

ආච්චි කිව්වා, "උඹටත් ඉන්ට පුළුවනි."

බල්ලා කිව්වා, "මට බුරලා හොරු එලවලා දෙන්ට පුළුවනි. මං යන්ට ඕනෑ ද ?"



ආච්චි කිව්වා, "කමක් නෑ, ඉඳපන්."

අමුත්තන් හැම දෙනා ම දිහා ආදරෙන් බලලා මෙහෙම කිව්වා. "මාත් එක්ක ඉන්ට හැමෝ ම කැමති හින්ද, එක් එක් කෙනාට උදවු කර ගෙන තමන්ට ඉන්ට තැන් හද ගන්ට ඕනැ. එත කොට අපි හැමෝටම හොඳින් ජීවත් වෙන්ට පුළුවනි."

මේ ශුභ ආරංචියත් එක්ක හැම දෙනා ම පිහත් කෝප්ප අස්පස් කරලා තම තමන්ගේ වැඩ කටයුතු කරන්නට පටන් ගත්තා.

එද ඉඳලා ඒ හැම දෙනා ම, අවුරුද්දෙන් අවුරුද්ද හොඳ සන්තෝසෙන් එකට ජීවත් වුණා.

නේපාලය

ගයානු සහ බැටළු පැටියා

ලේඛක

අභි සුබෙදි

චිත්‍ර

තෙක් බිර් මුඛියා

ගයානු පොඩි පිරිමි ළමයෙක්. ඔහු වැඩට හරි දක්ෂ යි. තාත්තාගේ ගොවිපළේ සතුන්ට ඔහු හරි ආදරෙයි. තාත්තා වයසට ගියායින් පස්සෙ, සතුන්ගෙ ස්වාමියා වෙන්නෙ තමන් විත්තිය දන්න හින්ද සතුන්ගෙ පැටවු වැඩියත් හොඳින් ඔහු රැක බලා ගත්තා. එක් එක් සතා ගැන හැම දෙයක් ම ගයානු දන හිටියා. සත්තුන්ගෙ ගති, වයස, උන් කන්නට කැමති තණකොළ ජාති – ඒ හැම දෙයක් ම ඔහු දන හිටියා. හැම සතකු ම ඔහු යහළුවන් හැටියට සැලකුවා.

පාවෙන වලාකුළු දිහා බලා ඉන්නට ගයානු හරි කැමති යි. පුළුන් කැට වගේ වලාකුළු වලට ඔහු වැඩියෙන් ම කැමති යි. ඒ මොකද දන්නවා ද ? ඒවා හරියට බැටළුවන්ගෙ ලොම් වගේ හින්ද. ඔහුගෙ තාත්තාගෙ ගොවිපළේ බැටළුවන් හිටියෙ නැහැ. ඒ වලාකුළු පොඩිති බැටළු ලොම් වගේ පෙනෙන්නෙ මොකක් නිසා ද කියලා ගයානු කල්පනා කළා. ඔහුගෙ අයියා කියූ විදියට ස්වර්ගයෙ ලස්සන සතුන් හුඟක් ඉන්න හින්ද ද ? අයියා කියලා තිබුණා ස්වර්ගයෙ ඉන්න දෙවියන් වහන්සේට සතුන් රංචු

ගණන් ඉන්නවා කියලා. දෙවියන් වහන්සේ විශේෂයෙන් බැටළු පැටවුන්ට ආදරේ හින්ද දෙවියන් වහන්සේගේ ගොවිපළේ බැටළු පැටවුන් හුඟක් ඉන්නවා කියලත් කිව්වා. ඉතින් ග්‍යානු හිතුවා මේ වලාකුළු පොඩ්ඩි ඒ බැටළු පැටවුන්ගෙ ලොම් වෙන්ටැති කියලා. තාත්තාගෙ ගොවිපළෙ ත් බැටළුවන් ඇති කරන්නට කියලා තාත්තාට කියන්නට ඕනැයි ග්‍යානු හිතුවා. එතකොට කොච්චර අපූරු වේවි ද ?

එද හැන්දෑවේ ග්‍යානු ගෙදර ගියේ ටිකක් පරක්කු වෙලයි. ඔහු තව ම නාවේ ඇයි ද කියලා තාත්තා මහ බල බලා හිටියා. සැන්ද ආකාසේ ඇති වලා පොඩ්ඩි දිහා ග්‍යානු බල බලා හිටියා. ඒ වලාකුළුවල පාට වෙනස් වෙනවා බලන්නට ඔහු හරි ආසයි. ඒත්, ඔහු පරක්කු වෙනවාට තාත්තා බය වෙයි කියලා ඉක්මනට ගෙදර ගියා. තාත්තා ඔහු බද ගෙන ඇහුවා ඔහු හිටියේ කොහේ ද කියලා. ග්‍යානු දැකපු දේ සේරම ඔහුට කිව්වා.

වෙන ද වෙලාවට ග්‍යානු නිද ගන්නට ඇඳට ගියේ නැහැ. ඔහුට මහන්සි නැහැ කියා කිව්වාට, ඔහුගේ තාත්තා ඔහු දිහා හොඳින් බලලා ඔහුගෙන් ඇහුවා, "ග්‍යානු, මගෙ පුතේ, මොකද මේ පුතාට වෙලා තියෙන්නෙ ?"

ග්‍යානුගෙ හිතේ තිබුණු දේ තාත්තාට හංගන්නේ නැතුව කිව්වා, "තාත්තෙ, ස්වර්ගයේ ඉන්න බැටළුවොත් මේ පොළොවෙ ඉන්න බැටළුවො වගේ ම ද ? උන්ගෙ ලොම් එක වගේ හින්ද බැටළුවොත් එක වගේ ඇති නේ ද ? ස්වර්ගයේ ඉන්න බැටළුවො අපේ ගොවිපළට ගේන්ට බැරි ද ? "ග්‍යානු ගෙ තාත්තා ඒ අදහසට කැමති වෙලා කිව්වා, "මං හිතන්නෙ පුළුවන් කියලා."

"එහෙනම් අපේ ගොවිපළට බැටළුවො ගේනවා ද, තාත්තෙ ?"

"මං ගේන්නම්කො ලස්සන බැටළුවො ටිකක්."

ග්‍යානුගෙ තාත්තා ගොවිපළේ ඉන්න සතුන් ගණනට තව බැටළුවන් හතර දෙනකුත් එකතු කළා. ග්‍යානුට හරි ම සන්තෝස හිතුණා. ටික

කාලයක් ගත වුණා ම බැටළුවන්ට පැටවු දෙන්නෙක් ඉපදුණා. ඒ බැටළු පැටවුන් කොච්චර ලස්සන ද කිව්වොත් ගයනු උන්ගෙන් ඈත් වෙලා හිටියේ රෑට විතර යි.

පුංචි සුදු බැටළු පැටවු උඩ පැන පැන, "බැ බැ" කිය කියා කෑගසමින් උන්ගෙ අම්මා ළඟට කන්ද පල්ලමේ දිව්වා. ගලක් උඩ වාඩි වෙලා හිටිය ගයනු ආකාසෙ දිහා බලලා කන්ද පල්ලමේ බැලුවා. ඔහු හිතුවා, සීතඳු පුළුන් වගේ වලාකුළු ඔවුන්ගෙ ගොවිපළට පාත් වෙනවා කියලා. බැටළු පැටවු වලාකුළු වගේ එහා මෙහා ගියා. කොළපාට තණකොළ පිට්ටනියෙ එහා මෙහා යන කොට උන්ගෙ හැඩ වෙනස් වුණා. ඒ වුණාට වලාකුළු වගේ සද්දයක් නැතුව හිටියෙ නෑ – 'බැ, බැ' කියලා කෑගැහුවා.

අහසෙ වලාකුළු පොඩිති, තාත්තා පහතට ගෙනා එක ගැන ගයනුට හරි ආඩම්බර හිතුණා. තාත්තා පොරොන්දුව ඉෂ්ට කළාට හුඟක් ස්තුතිවන්ත වුණා. තාත්තාට ඔහු හුඟක් ආදරේ කළා.

බැටළු පැටවු ඉක්මනින් ලොකු වුණා. ගයනුට උන් එන්න එන්න ම ලස්සන යි. ලොකු වෙන්න වෙන්න බැටළු පැටවුන්ගෙ ගති වෙනස් වන හින්ද, උන් ලොකු වෙනවා බලන්නට ගයනු හරි කැමති වුණා. උන් දූත් වැඩිය දුව පනින්නෙ නැතුව, රංචුවත් එක්ක ම හිටියා. කෑගැහුවෙත් ඉඳ හිටලා යි, ගයනුට පැටවු දෙන්නා නැතුව ම බැරි තරම්.

එක දවසක් ඔහුට විශ්වාස කරන්නට බැරි දෙයක් අහන්න ලැබුණා. තාත්තාගෙ යාළුවෙක් බැටළු පැටවකු මරන්න කතා කළා. අයියෝ ඒ වගේ දෙයකට තාත්තා කැමති වෙන්නෙ කොහොම ද ? තාත්තා එහෙම දෙයක් නොකරන විත්තිය ගයනුට හොඳට විශ්වාස හින්ද තාත්තා එක්ක ඒ ගැන කතා කළේ වත් නැහැ.

එක දවසක් ඔහු අම්මා ත් එක්ක මාමලාගේ ගෙදර ගියා, ඔහුගෙ මස්සිනාගේ මඟුල් ගෙදරට. ඒත් ඔහුගෙ හිත තිබුණේ ගොවිපළේ බැටළු

පැටවුනුත් එක්ක. සමහර වෙලාවට ඔහුට බය හිතුණා පැටවු මරාවි කියලා. ගයානුට මගුල් ගෙදර ඉන්න හිත දුන්නේ නැහැ – ගෙදර එන්ට ම යි හිතුණේ.

ගෙදර ආවා ම ගයානුගෙ අක්කා කිව්වා බැටළු පැටියකු මැරුවා කියලා. තාත්තාගෙ අර යාළුවා ඇවිත් තාත්තාව කොහොම හරි ඒකට කැමති කර ගෙන තියෙනවා. ගයානුට හරි ම බය හිතුණා. ඔහු පිදුරු මඩුව පිටි පස්සට ගිහින් හෙමිහිට ඇඬුවා. "අයියෝ, තාත්තෙ – තාත්තා මොකද මේ කරලා තියෙන්නේ ?"

ටිකකට පස්සෙ, ඔහු ආපසු ගෙට ගියා. තාත්තා ඔහු දිහා බලලා, බැටළු පැටියා මැරුවාට ඔහුගේ මුහුණේ කණගාටුවක් පෙනෙන්නට නැති හින්ද, සතුටු වුණා. ගයානු තව තවත් බය වුණා. අහසෙ වලාකුළු තරහෙන් එහා මෙහා පා වුණා. පුළුන් වලාකුළුවලින් බාගයක් ම අහසෙන් ගිහින්.

ඉතිරි බැටළු පැටවා මරණයෙන් බේරා ගන්නට ගයානු තීරණය කළා. තාත්තා දැන් ඔහුට ආදරේ නැතැයි කියලා ගයානු හිතුවා – නැත් නම්, අනිත් බැටළු පැටියා මරන කොට, ඔහු ගැන හිතන්න ඕනැ නේ.

ගයානු ගෙදරින් පිට වෙලා ගියා, හැන්දෑවෙ, පිදුරු මඩුව යි ගව මඩුව යි පැත්තෙ කළුවර වැටී ගෙන එන වෙලාවෙ. බැටළු පැටියා ලණුවකින් ගැට ගහ ගෙන, පුළුවන් තරම් ඉක්මනින් පිට වෙලා ගියා. බැටළු පැටියා දැන ගත්තා ගයානු ඌ එක්ක යන්නෙ ඇයි කියලා – ඉතින් ඒ හන්ද ඌ කෑගැහුවේ නැහැ. ගයානු එක්ක ලෝකෙ අනික් කෙළවරට යන්ට වුණත් ඌ ලෑස්ති යි.

තාත්තාගෙ පරණ ගෙදර තිබුණ තැන තියෙන දොළ පාර හරහා ඉක්මණින් ම ගියා. වෙලේ ලොකු පිදුරු ගොඩකුත් පුංචි අකුලකුත් තිබුණා. හැංගිලා ඉන්න හොඳ ම තැන මෙතන යි කියලා ගයානුට හිතුණා. මේ බැටළු පැටියත් එක්ක අලුත් ගොවිපළක් මෙතන පටන්

ගන්නට පුළුවන් කියලා ගෑනු හිතුවා. මේ ඉඩම ත් තාත්තාට අයිති හින්ද එතන ගොවිපළක් දනවාට කවුරුත් හරස් කපන එකක් නැහැ.

පිදුරුමඩුව පිටි පස්සට වෙලා රෑ ගත කරන්ට ගෑනු හිතා ගත්තා. බැටළු පැටියා ළඟින් තියා ගෙන නිදා ගන්නට තැනක් පිදුරුවලින් හද ගත්තා. හඳ එළිය වැටුණු අහසෙ හැම තැන ම සිහිදු පුළුන් වලාකුළු පොඩිති ඔහුට දකින්නට ලැබුණා. හඳ ඒ වලාකුළු අස්සට යනවා, ආයෙමත් එළියට එනවා. කොච්චර ලස්සන ද ? බැටළු පැටවා හෙමිහිට හුස්ම ගන්න සද්දෙ ඇහුණා. ඉඳ හිට පිදුරු ටිකක් හැපුවා. අහසත් පොළොවත් එක්ක එකට ඉන්නවා වගේ ගෑනුට දැනුනේ. ගොවිපළට ස්වර්ගය ගෙනල්ලා, වැඩිය හිතන්නෙ නැතුව මිනිස්සුන් එය මරා දමන්නෙ කොහොම ද කියලා ගෑනු හිතුවා.

බැටළු පැටවත් එක්ක පරණ ගොවිපළේ ගත කරපු තුන් වෙනි දවසත් ගත වුණා. ගෑනුට දැන් හරි ම බඩගිනි යි. බැටළු පැටවා වෙළේ හිට ගෙන මොනවා ද කියනවා වගේ ඔහුට තේරුණා. ගිහින් බැලින්නම් වෙලේ හැම තැන ම වගේ බතල තිබුණා. හොඳ බතල ටිකක් හාරා ගෙන ඒවා කෑවා.

එද ගැන්දෑවෙ, ඔහුට තාත්තා මතක් වුණා. ආපහු ගෙදර යන්නට ත් හිතුණා. ඒත් ආපහු යන එකට බැටළු පැටවා හොඳට ම බය වුණා. ඉතින් ගෙදර යන අදහස ගෑනු හිතෙන් අහක් කළා. රෑ බෝවෙන කොට පිදුරු ගොඩේ නිදා ගන්න හදන කොට, තාත්තා එතන හිට ගෙන ඉන්නවා ගෑනු දැක්කා. තාත්තා කිසි කතාවක් නැතුව හරි ම දුකෙන් හිටියේ. ගෑනු තාත්තාට ආදරෙයි. ඔහුට තාත්තාව බදා ගන්නට හිතුණා. ඒත් ඔහු එහෙම කළේ නෑ. ඒ මොකද – තාත්තා පුළුන් ගොඩ වගේ හිටපු ඔහුගෙ බැටළු පැටවා මැරුවා, ඔහුගේ පුළුන් වලාකුළු පොඩිත්ත නැති කළා. තාත්තා තවත් දෙයක් නැති කරලා – ඒත් ඒ මොකක් ද කියලා හරියට ම හිතා ගන්ට බැරි වුණා.

ඔහුගෙ තාත්තා ඔහුව බදා ගත්තා. වඩා ගෙන ඉම්බා. මූණ කඳුළුවලින් තෙමිලා – හෙමිහිට මෙහෙම කිව්වා, “මං ආයෙත් බැටළු පැටවා මරන්නෙ නෑ, මං මීට පස්සෙ ස්වර්ගය අපේ ගොවිපළේ හැමදා ම තියා ගන්නම්. !” තාත්තා බැටළු පැටවා හෙමින් අතගාලා, ග්‍යානු උස්සලා කර උඩ තියා ගත්තා. පුළුන් වලාකුළු පොඩිති අහසෙ පාවෙද්දි තාත්ත ත් ග්‍යානු ත් ආපහු ගෙදර ගියා. බැටළු පැටවා ත් ඔවුන් පිටි පස්සෙන් ගියා.

මොන්ගෝලියාව

අනාථ වූ සුදු ඔටුවා

(මොන්ගෝලියාවේ ජන කථා)

චිත්‍ර

බද්මාරගිඉන් ව්සොග්

එකමත් එක කාලෙක කුමාරයකු යි පෝසත් මිනිහකු යි හිටියා. මේ කුමාරයාගෙ රජ පවුලෙත් කසාද බඳින්න හිතූ පෝසත් මිනිහා කුමාරයාට සුදු ඔටුවන් සීයක් තෑගි කරන්ට තීරණය කළා. ඔටුවන් සීය තෑගි දෙන්ට සූදනම් වෙන කොට, ඔහුට දකින්නට ලැබුණා, හිටියේ ඔටුවන් අනූ නම දෙනකු විතර යි කියලා. ඉතින්, සීය වෙන්නට ඔහුගෙ සුදු ඔටු දෙන දුන්නා. ඔටු දෙනගෙ සුදු පැටවා ගෙදර තියා ගත්තා.

ඔටු පැටවා රෑ දවල් දෙකේ ම අම්මා සොයා සොයා කෑගසමින් ඇඬුවා. පෝසත් මිනිහා විශාල බොකුටු ගෙයක් හදවලා, ඒක ලස්සන මල්වලින් සරසලා, ඔටු පැටවා ඒ ගෙට දැම්මා. ඒ වුණාට, ඔටු පැටවා දිගට ම කෑගැහුවා ඒ ගේ කඩා වැටෙන කල්. ඌ, කඳු හෙල් පහු කරමින් තණබිම් කාන්තාර ඔස්සේ දිව්වා අම්මාට, හීන් හඬින් අඩ අඩා අඬගසමින්. අන්තිමට පෝසත් මිනිහාගෙ අශ්වයන් බලා ගන්න මිනිහා මේ ඔටු පැටවා දැක්කා. ඔහු ඉක්මනට අගිස්සෙ කොට් හමෙන් වළල්ලක් හයි කරපු රියන් දහයක් දිග යකඩ කසය ඇරැ ගෙන, ඔහුගේ ළා –

ගුරු පාට අශ්වයා පිටට නැගලා ඔටු පැටවා පස්සෙන් එළෙව්වා. ඔහු ඔටු පැටවා අල්ලගෙන, පුළුවන් තරම් හයියෙන් යකඩ කසෙන් ඌට තැළුවා. තළන ගමන් මෙහෙම කිව්වා, "මං උඹේ ඔය පවුකාර හම මගෙ බල්ලන්ට ලගින්ට දනවා. උඹේ ඔය මස් මගේ අශ්වයන් බලන කොලුවාට දෙනවා. එත කොට උඹට තේරෙයි."

ඔටු පැටවා ගෙනත් දුවැත්ත කළු ඔටුවකුගෙ කරේ ගැට ගැහුවා. ඔටු පැටවා උගේ ලණුව ඒ අතටත් මේ අතටත් ඇද ඇද, රෑ දවල් දෙකේ ම නොසැහෙන්න ඇඬුවා.

"උඹට මේ හැම තිස්සෙ ම මොර දෙන්නෙ නැතු ව ඉන්ට බැරි ද ?" කළු ඔටුවා ඇහුවා. එත කොට ඔටු පැටවා ඌ ගැන සේර ම විස්තර කිව්වා. කළු ඔටුවාට, පැටවා ගැන දුක හිතුණා. ඌ කිව්වා, "මට අද රෑට නිදන්ට දියන්. උඹ මොර දෙන්නෙ නැතුව ඉඳින්. උදේ එළිවෙන්ට කලින්, උඹේ ලණුව මගෙ හක්කෙ දත්වලින් අර ගෙන, ගලක ගාලා කඩලා, උඹට යන්ට ඉඩ දෙන්නම්."

ඉතින් එද රෑ ඔටු පැටවා සද්ද නැතුව නිද ගත්තා. කළු ඔටුවා පැටවාගෙ ලණුව උගෙ ලොකු කටින් හපාගෙන පුළුවන් තරම් වීරිය දලා ගලක අතුල්ලලා ලණුව කැඩුවා. උදේ පාන්දර ඔටු පැටවාට නිදහසේ යන්ට ඉඩ දුන්නා.

හීන් හඬින් කැගසමින් ඔටු පැටවා කඳු හෙල් පහු කර ගෙන තණබිම් කාන්තාර ඔස්සේ දිව්වා. අශ්වයන් බලන මිනිහා ආපසු ඔටු පැටවා පස්සෙ එළෙව්වා. ඌව අල්ලා ගන්න ඔන්න – මෙන්න තියෙද්දී, අශ්වයා එක පාරට ම නතර වෙලා කිව්වා, "ලෝකෙ අනාථ වෙච්ච සත්තුන් කොච්චර මං දකලා තිබුණත්, මේ ඔටු පැටවා තරම් දුකෙන් ඉන්න කිසි ම සතෙක් දකලා නෑ නේ."

එහෙම කියනවාත් එක්ක ම අශ්වයා මැරුණා. ඔටු පැටවා දිගට ම දුව ගෙන ගියා. ඊළඟට උනට පැටවු දෙන්නෙක් එක්ක හිටි වෑක දෙනක් මුණ ගැහුණා.

"මේ විදියට මොර දෙන්නෙ, උඹ මොන වගේ සතෙක් ද ? මං උඹව කනවා."

ඔටු පැටවා අම්මාගෙන් වෙන් වුණු හැටි වෘකයන්ට කිව්වා. අන්තිමට කිව්වා, "හොඳයි එහෙනම් මාව කෑවට කමක් නෑ. ඉස්සරහින් මාව කනවා නම් මෙන්න මගෙ ලස්සන දිග බෙල්ල. යට ඉඳන් කනවා නම්, මෙන්න මගෙ සිහිති කකුල්. උඩ ඉඳන් මාව කනවා නම්, මෙන්න මගෙ රවුම් මොල්ලි පොඩිති. පැත්තකින් මාව කනවා නම්, මෙන්න මගෙ කෙට්ටු ඉළ ඇට. මාව පිටි පස්සෙ ඉඳන් කනවා නම්, මෙන්න මගෙ ලස්සන බොලැට දෙක."

එත කොට වෘකයා කිව්වා, "මීට ඉස්සර අනන්ත අනාථයො දැක්කට උඹ වගේ අනාථයෙක් මං දැක්කෙ නෑ," ඉතින් බඩගින්නෙ හිටි වෘක දෙන උගෙ පැටියෙක් කා දැම්මා. ඔටු පැටවා ඇල්ලුවේ වත් නෑ.

ඔටු පැටවා කඳු හෙල් පහු කරමින්, තණ බිම් කාන්තාර ඔස්සෙ දුව ගෙන ගියා. එක පාරට ම ඌ ඉදිරියේ මහ ගන කළු වනාන්තරයක් මතු වුණා. ඇතුළු වෙන්ට වත් වටේ යන්ට වත් බැරි වනාන්තරයක්. ඔටු පැටවා පුළුවන් තරම් හයියෙන් අඩ අඩා ඉස්සරහට ත් පස්සට ත් දිව්වා. අන්තිමට ඌ ගස් නැති තැනක් දැක්කා. ඒ දිගේ දුවලා කැලෑවෙන් එළියට ඇවිත් දිගට ම දුව ගෙන ගියා. ඊළඟට ඌ නටන වතුර තියෙන මූදක් ළඟට ආවා. ඌට මූදෙන් පීනන් යන්ට වත් වටේ යන්ට වත් බැහැ.

ආයෙත් ඔටු පැටවා මොර දෙන්න පටන් ගත්තා. වෙරළේ ඉස්සරහට පස්සට දිව්වා. එක පාරට ම, ගෙයක් වගේ ලොකු යෝධ කැස්බෑවෙක් මතු වෙලා තරහෙන් කිව්වා, "මේ මොන පවුකාර සතෙක් ද ! මහන්සි වෙලා වැඩ කරන අයට තිකම් ඉන්ට දෙන්නෙ නැත්තෙ ඇයි ?!"

ඔටු පැටවාට සිද්ද වුණු දේ ඌට කිව්වා. යෝධ කැස්බෑවාට ඔටු පැටවා ගැන දුක හිතිලා ඌව මූදෙන් එතෙර කළා.

ඔටු පැටවා කඳු හෙල් පහු කර ගෙන තණබිම් කාන්තාර ඔස්සේ, උගේ අම්මාගෙ කටහඬ ඇතින් ඇහෙන තුරු දුව ගෙන ගියා. ඔටු දෙනටත් උගෙ පැටවාගෙ කටහඬ ඇහිලා, ඌට කතා කළා. එත කොට, අර පෝසත් මිනිහා, සොල්දදුවන් තුන් දහක් වට කර ගෙන හිටි යකඩ ගෙයක ඔටු දෙන දැම්මා. ඒ වුණාට, යකඩ ගෙයි බිත්ති කඩා ගෙන, සොල්දදුවන් තුන් දහ මරලා දගෙන, ඔටු දෙන පැටවා ළඟට දුව ගෙන ගියා.

අම්මාගෙ රන්වන් අඩි පාර දිගේ ඔටු පැටියා ගිහින් ඇගේ රසවත් කිරි බිව්වා. ඉක්මනට උන් දෙන්නාට හොඳ ගොවියකු මුණ ගැහුණා. ඊට පස්සෙ ඔහුත් එක්ක සතුටින් වාසය කළා.